# අනුරාධපුර අවධියේ කලාකෘති සඳහා යොදාගත් සත්ව සංකේත හා එහි උපයෝගීතාව

කේ.ජී.එම්.කේ. මධුෂානි චන්ද්‍රපාල

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
madushanichandrapala@gmail.com

ප්‍රමුඛ පදඃඅනුරාධපුර අවධිය, කලාකෘති, සත්ව සංකේත,

## හැඳින්වීම

පැරණි තාක්ෂණය , පැරණි ද්‍රව්‍යමය මාධ්‍යය , පැරණි වාස්තුවිද්‍යාව , පැරණි සමාජ සංවිධාන ව්‍යුහය සහ රාජකීය බලය තීරණය වූයේ හා පාලනය වූයේ බෞද්ධ සංස්කෘතික මනසකින් යුත් බහුතර ජනතාවගේ පිළිගැනීම අනුව ය. එම යුගයේ කලා ශිල්පියෙකුට තමන්ගේ සිතෙහි ජනිත වූ භාවාත්මක හැඟීම් ඒ අන්දමින් ම ප්‍රකාශනයට ඇතුළත් කිරීමට නොහැකි වූයේ එබැවිනි. චිත්‍රයකට හෝ කැටයමකට හෝ මූර්තියකට නැගීමේදී මනෝභාවයන් සංකේත ස්වරූපයෙන් ඉදිරිපත් කිරීමට බලපෑ ප්‍රධාන සාධකයක් වශයෙන් එය සැලකිය හැකිය. ප්‍රාථමික අවධියේ මනුෂ්‍යයන් පවා සිය මනෝභාවයන් අන්‍යයන්ට ප්‍රකාශ කිරීමට යම් යම් සංකේත භාවිත කරන්නට ඇත. අනුරාධපුර රාජධානි අවධියේ විසූවන් තමන් නිර්මාණය කළ ගල් කැටයම් හා චිත්‍රවලට බොහෝ දුරට පාදක කර ගෙන ඇත්තේ ස්වාභාවික පරිසරයේදී සිදු කළ නිරීක්ෂණයන් ය. ඔවුන් විසින් තම අදහස් ප්‍රකාශ කිරීමේදී බොහෝ දුරට සත්ව රූප යොදා ගෙන ඇති බැව් හඳුනාගත හැකි ය. විශේෂයෙන් ම අනුරාධපුර අවධියේ බෞද්ධ භික්ෂූන් වාසය කළ සෑම ගොඩනැගිල්ලක ම පාහේ කැටයම් අතර සත්ව රූප ඇතුළත් කර තිබීම තුළින් එකල කලාකරුවා බෞද්ධාගමික සංකල්ප හා මුසු වූ ගැඹුරු අර්ථයක් මෙතුළින් සංකේතවත් කළ බව උපකල්පනය කළ හැකි ය.

## අරමුණ

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ අනුරාධපුර අවධියේ කලාකෘති සඳහා යොදාගත් සත්ත්ව සංකේත හා එහි උපයෝගීතාව අධ්‍යයනය කිරීමයි. ඒ අනුව අනුරාධපුර අවධියේ කලාකෘති සඳහා සත්ව සංකේත යොදාගෙන ඇත්තේ කෙසේ ද යන ගැටලුව පාදක කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කරන ලදි.

## ක්‍රමවේදය

විවිධ පර්යේෂකයින් විවිධ ශෛලමය කැටයම් පිළිබඳව බහුල වශයෙන් අවධානය යොමු කරන නමුත් සත්ව සංකේත සම්බන්ධව අවධානය යොමු වන්නේ අල්ප වශයෙනි. තව ද මෙම ශිලා කැටයම් විනාශයට පත් වීමේ ප්‍රවණතාවක් ද පවතී. එබැවින් මේ පිළිබඳව අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය කරුණක් බව පෙනේ.

මෙම පර්යේෂණය සඳහා අවශ්‍ය තොරතුරු රැස් කර ගැනීමට අනුරාධපුර දිස්ත්‍රික්කයේ විවිධ ස්ථානවල පිහිටි ශිලා කැටයම් අධ්‍යයනය කරන ලදි.

සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය කිරීමෙන් ලබාගත් තොරතුරු ද මෙම අධ්‍යයනයේ

දී පිටිවහලක් විය. ඡායාරූප ලබා ගැනීම තළින් රැස් කරගත් කරුණු මනාව තහවුරු කර ගැනීමට හැකියාව ලැබිණි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ප්‍රධාන වශයෙන් සත්ව කොට්ඨාස කලාත්මක නිර්මාණවල යොදා ගැනීමේදී සතුන් අතරින් සිංහයා, ඇතා, අශ්වයා සහ ගවයා යොදාගෙන තිබෙනු දැකිය හැකි ය. ඔවුනතුරින් අශ්වයා සහ සිංහයා ලංකාවේ ශිල්පීන් ස්වකීය දැකීමෙන් පහළ වූ ආහ්ලාදජනක හැඟීමකින් කලා නිර්මාණවල යොදා ගත්තේ දැයි සැක සිතේ. එහෙත් අශ්වයා පසු කලෙක වෙළෙඳුන් මඟින් ලංකාවේ භාවිතයට ගත් සතෙකු වූවාට පසු ලාංකීය ශිල්පීන්ට ද අත්දැකීමක් වන්නට ඇත. දේශජ සතුන් නොවූ සිංහයා සහ අශ්වයා ඉන්දීය කලාවන්හි බලපෑමෙන් හුරු වූ බව සිතන්නට පුළුවන.

## සිංහයා

සිංහයා ශ්‍රේෂ්ඨත්වය හා තේජස පිළිබිඹු කිරීමේ සංකේතයකි. අනුරාධපුර යුගයේ ගල් කැටයම්වල වූ සිංහයන්ගේ කේශර කෙළවර බොහෝ දුරට වක්‍ර වූ ස්වරූපයක් දරයි. එම කේශර මුහුණ වටා ම නෙළා ඇත. මිහින්තලයේ සිංහ පොකුණේ ඇති සිංහ කැටයම මෙයට කදිම නිදසුනකි. අනුරාධපුරයේ සඳකඩ පහන්වල වූ සිංහ රූප නෙළා ඇත්තේ පාර්ශ්වික ව දර්ශනය වන ලෙසිනි (මනමේන්ද්‍රආරච්චි, අදිකාරිඃ 2014). කැටයම්වල වූ සිංහ රූපවල හිස මනාව බාහිරට විවෘතව ඇති සේ නෙළා ඇත. මෙය ස්වාභාවිකත්වයෙන් මිදී ඉදිරිපත් කර ඇති කැපීපෙනෙන ශෛලිගත ලක්ෂණයක් ලෙස හැඳින්විය හැකි ය. මෙම කැටයම්වල වල්ගය ප්‍රමාණයට වඩා ඉතා දික්ව හුවා දක්වා ඇති බව දැකිය හැකි ය. අනුරාධපුර යුගයේ සිංහ රූප බොහෝමයක සිංහයන්ගේ ලිංගේන්ද්‍රිය මනාව දක්වා තිබීම විශේෂත්වයකි. නමුත් මිහින්තලයේ සිංහ පොකුණේ වූ කැටයමේ මෙම ලක්ෂණය දක්නට නොලැබේ. මීට අමතරව අනුරාධපුර යුගයේ ඇතැම් නිර්මාණවල සිංහයා තවත් සත්ව විශේෂ සමඟ සම්මිශ්‍රණය කර ඉදිරිපත් කිරීම දැකිය හැකි ය. සිංහ සිරුරකට ඇත් හිසක් බද්ධ කර නිර්මාණය කරන ලද ගජසිංහ කැටයම මේ සඳහා කදිම නිදසුනකි.

## ඇතා

ඇත් දළ තුළ ඇති ගජමුතු සිතු පැතු සම්පත් දෙන වාසනාවකි යන්න ඉතා ඈත කලෙක සිට ජනතාව අතර මුල් බැසගත් සංකල්පයකි. මෙයින් පෙනීයන්නේ බෞද්ධ කලාකරුවන් ඇත් රූපය යොදන්නට ඇත්තේ හුදෙක් අලංකාරය සඳහා පමණක් නොව ඊට වඩා ගැඹුරු සංකල්ප නිරූපණය කරන්නට විය හැකි ය. චක්‍රවර්තී රජ කෙනෙකුගේ සුවිශේෂී ලක්ෂණය සප්ත රත්නයන් පහළ වීමයි. ඇතා ද මේ වස්තු අතුරින් එකකි. දෙවියන් අතර ප්‍රධානියා වන්නේ ඉන්ද්‍ර යි. එබඳු අයෙකුගේ වාහනය ලෙසින් ඇතා යොදාගෙන ඇත්තේ ඇතාගෙන් සෞභාග්‍යය නිරූපණය වන හෙයින් යැයි කීම සාධාරණයැයි උපකල්පනය කළහැකි ය. අනුරාධපුරයේ රන්මසු උයනේ හා ඉසුරුමුණියේ ගල් තලාවල නෙළා ඇති ඇත් රූප ප්‍රමාණයෙන් ඉතා විශාල ය. කණ්ඨක චෛත්‍යයේ වාහල්කඩක වූ කුළුණක ඇත් රූපයක් වේ. එහි පසු ගාත්‍රා යුවළ දණහිසින් නවා සිටිය ද ඉදිරි ගාත්‍රාවලින් ගමන් කරන ඉරියව්වක් නිරූපණය කරයි.මිහින්තලයේ සිංහ පොකුණේ වූ කැටයම් අතර ඇතෙකු සහ මිනිසෙකු දැක්වෙන කැටයම ඉතා උසස් ගණයේ කලා නිර්මාණයක් ලෙස පෙන්වාදිය හැකි ය. මීට අමතරව අනුරාධපුර පූජා නගරයේ සඳකඩපහන්වල නොයෙක් ඉරියව් විදහා දැක්වෙන ඇත් රූප නෙළා තිබේ. මෙම සඳකඩපහන් සියල්ලෙහිම පාහේ ඇතා

ඇවිදින හෝ දිවයන ආකාරයෙන් නිරූපණය කර තිබේ. මෙම කැටයම්වල පාද පිහිටීම , වල්ගය සහ හොඬය වැනි අංග නිර්මාණය කර ඇති ආකාරය අධ්‍යනය කිරීමේදී අනුරාධපුර යුගයේ කැටයම්කරුවා ශෛලීගත ස්වරූපයෙන් බැහැරව ස්වභාවිකත්වයට නැඹුරුව ඇත් රූප නෙළීමට උත්සාහ කර ඇති බව පැහැදිලිව ම අවබෝධ කරගත හැකි කරුණකි.

**අශ්වයා**

අනුරාධපුර යුගයේ සඳකඩපහන්වල වූ අශ්වයින් දුවන ඉරියව්වෙන් නෙළා ඇති බව දැකගත හැකි ය. උන්ගේ හිස විශාල වන අතර ම ගෙල කෙටි හා මහත් ය. සමස්ත ශරීරය හා පාද ශරීර උසට සාපේක්ෂව ස්ථූල ය. නාසය , ඇස් හා මුඛය මනාව ස්වභාවික අයුරින් කැටයම් කර තිබේ. දෙකන් මැදින් ආරම්භව උරහිස දක්වා දිවෙන දිගු ලොම් තීරය පැහැදිළිව නෙළා ඇත. මෙම අශ්ව කැටයම්වල ලිංගේන්ද්‍රිය ඉතා නිවැරදි ලෙස හුවාදක්වා තිබේ. නිර්මාණකරු කැටයම් කරඇත්තේ දුවන ඉරියව්වේ අශ්වයෙකු බැවින් දිවීමේදී පා පිහිටන ආකාරයත් ගාත්‍රා වැලමිටින්, දණහිසින් හා කුරවලන් නැවෙන ආකාරයත් බෙහෙවින් ස්වාභාවික ය (මනමේන්ද්‍රආරච්චි, අදිකාරිඃ 2014).ඒ අනුව අනුරාධපුර යුගයේ කැටයම් අතර දැකිය හැකි අශ්ව රුවෙහි හැකි පමණින් ස්වාභාවික ශාරීරික ලක්ෂණ ඉස්මතු කර ඇති අතර කිසිදු අයුරකින් ශෛලීගත ස්වරූපයක් නිරූපණය නොවේ.

**ගවයා**

අනුරාධපුර යුගයේ කැටයම් අතර ගව රුව ද ශෛලීගත ස්වරූපයෙන් බැහැරව නිර්මාණය කර තිබේ. සඳකඩපහනේ වූ අශ්ව රුව මෙන් ම ගවයා ද නෙළා ඇත්තේ ගමන් කරන ඉරියව්වකිනි. ශරීරයට සාපේක්ෂව හිස මඳක් විශාල වන අතර ගෙල කෙටි හා ස්ථූල ස්වභාවයක් ගනී. වල්ගය දිගු ය. උරහිස මත වූ මනාව වර්ධනය වූ මොල්ලිය අනුව හැඟෙනුයේ මෙම සතුන් කරත්ත ඇදීම ආදී බර වැඩ සඳහා යොදා ගන්නට ඇති බවය (මනමේන්ද්‍ර ආරච්චි, අදිකාරිඃ 2014). මෙම සඳකඩපහන්වල නිරූපණය කර ඇති ගවයින්ගේ අං යුවළ ඉතා කෙටි වීම විශේෂත්වයකි. එමෙන් ම ගවයින්ගේ ගෙලේ සිට ඉදිරි ගාත් තෙක් ගෙල ප්‍රදේශය ඉදිරියට නෙරා ඇති ආකාරයෙන් දක්වා තිබේ. ඊට අමතරව අශ්ව කැටයමේ මෙන් ම ගවයාගේ ලිංගේන්ද්‍රිය පැහැදිළි ලෙස කැටයමට ඇතුළත් කොට ඇති අයුරු දැකගත හැකි ය. අනුරාධපුර පෙදෙසේ වූ ශිලා කැටයම් අතර ගවයා සුලබවම දැකිය හැකි වන්නේ සඳකඩපහනේ වීම ද විශේෂත්වයකි.

මීට අමතරව අනුරාධපුර යුගයේ කලාකෘති සඳහා යොදාගත් සත්ව සංකේත අතර නාගයා, මකරා, භෛරව රූප, සුනඛයා සහ මත්ස්‍ය රූප මෙන් ම හංසයා, මොණරා, කපුටා ඇතුළු පක්ෂීන් නිරූපණය වන රූප අතිවිශාල ප්‍රමාණයක් දැකගත හැකි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


මනමේන්ද්‍රආරච්චි, කැළුම් නලින්ද සහ අදිකාරි, ගාමිණි. (2014)***අනුරාධපුර පුරාජෛවවිවිධත්වය සහ වර්තමාන ජෛවවිවිධත්වය***.කොළඹ 12ඃ ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

වික්‍රමගමගේ, චන්ද්‍රා. (2004)***රජරට ප්‍රවේණිය.*** කොළඹඃ ශ්‍රී ලංකා මහ බැංකුව.

සෙනෙවිරත්න, අනුරාධ. (2002)***පුරාණ අනුරාධපුරය***.කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.